# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**

**2026 ජනවාරි/පෙබරවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

## ආර්ථික විද්‍යාව
**(නව නිර්දේශය)**

**සාර්ව ආර්ථික විද්‍යාව**

**ECON 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. (i) ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහ ආකෘතිය භාවිත කරමින්, රජයේ විශාල උත්තේජක පැකේජයක් මගින් විවෘත ආර්ථිකයකට ඇති විය හැකි බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) රටක ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අවපාතයකට මුහුණ දෙන විට චක්‍රීය ප්‍රවාහයට කුමක් සිදුවේ දැ යි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. කල්පිත ආර්ථිකයක වියදම් සංරචක පහත පරිදි වේ යැයි සිතමු.

$$C = 50 + 0.8Yd$$
$$I = 70$$
$$G = 200$$
$$TR = 50$$
$$t = 0.3Y$$
$$X = 250$$
$$M = 170$$

ඉහත විස්තර උපයෝගී කරගනිමින්,

(i) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.

(ලකුණු 08)

(ii) සමතුලිත ජාතික ආදායම් මට්ටමේදී පරිභෝජනය සහ ඉතිරිකිරීම් ගණනය කරන්න.

(ලකුණු 06)

(iii) මෙම ආර්ථිකයේ විදීම් සහ කාන්දුවීම් ගණනය කරන්න.

(ලකුණු 03)

(iv) මෙම ආර්ථිකයේ ජාතික ආදායම් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

(අ.පි.බ.)

03. (i) පොළිය පිළිබඳ සම්භාව්‍ය න්‍යායේ විශේෂ ලක්ෂණ සහ එහි සීමා කවරේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

(ii) පොළිය පිළිබඳ ණය අරමුදල් න්‍යාය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

04. කේන්සියානු මුදල් ඉල්ලුම් න්‍යායෙන් ඉදිරිපත් කරන මුදල් ඉල්ලුම තීරණය කිරීම සඳහා බලපාන සාධක විවේචනාත්මකව සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

05. ''උද්ධමනය'' යන්න පැහැදිලි කර ශ්‍රී ලංකාවේ උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

06. IS-LM ආකෘතිය භාවිතයෙන් සංකෝචනාත්මක මුදල් ප්‍රතිපත්තියක ආර්ථික බලපෑම සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

07. උදාහරණ භාවිත කරමින්, නිරපේක්ෂ සහ සාපේක්ෂ වාසි ජාත්‍යන්තර වෙළෙඳ රටාවට බලපාන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

08. පහත සඳහන් සංකල්ප සඳහා කෙටි පැහැදිලි කිරීම් සපයන්න.
(i) කේන්සියානු ද්‍රවශීලතා වරණ න්‍යාය
(ii) ද්‍රවශීලතා උගුල
(iii) විනිමය අවප්‍රමාණය සහ අතිප්‍රමාණය
(iv) ඉල්ලුම් කම්පන සහ සැපයුම් කම්පන

(එක් කොටසකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 20)

*****************************